**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව - 2024**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාව වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| බද්ධ ව්‍යාපාර වලින් මිලදී ගැනීම් මත ඇතිවන ණයහිමි ශේෂය ගිවිසුම් ප්‍රකාරව දින 60ක් ඇතුළත නිරවුල් කළ යුතු වුවත් දින 60ක් ඉක්මවූ රු.මිලියන 1,662 ක් වූ ශේෂ නිරවුල් කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයෙන් මුදල් නිදහස් කරන ප්‍රමාණය අනුව ආයතනයේ අවශ්‍යතාවය මත අදාල මුදල් කළමනාකරණය කර ගනිමින් හැකි උපරිම ආකාරයෙන් අදාල ගෙවීම් බද්ධ ව්‍යාපාර අතර බෙදාහැරීමට කටයුතු කරන බව. | ගිවිසුම් ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කළ හැකිවන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම සකස් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 3(2)iii | රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කරන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05 ක් පිහිටුවීමේ අරමුණින් ආරම්භ කරන ලද ලෝටස් ෆාමා ව්‍යාපෘතිය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර නොතිබුණු අතර 2021 සිට සමාලෝචිත වර්ෂය දක්වා ප්‍රසම්පාදන කටයුතු හා සේවක වැටුප් ගෙවීමටත්, අදාළ ඉඩම | ඖෂධ නිෂ්පාදනයේ නියැලී සිටින බැවින් ව්‍යාපෘතිය යෝජනා කළ මූලික අවස්ථාවේ අනුමැතිය සඳහා මූල්‍ය ශක්‍යතා අධ්‍යයනයක් පමණක් කර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මිලදී ගැනීමටත් පිළිවෙලින් රු.මිලියන 55.58 ක් හා රු.මිලියන 322.41 ක් ලෙස එකතුව රු.මිලියන 377.99 ක් වැයකර අතරමග නවතා දමා තිබුණි. | | |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි පාඩු ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2025 වර්ෂයට අදාළව හානි පාඩු ලේඛණයක් පවත්වාගෙන යාමට මේ වන විට කටයුතු කර ඇති බව. | -එම- |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VI වැනි පරිච්ඡේදය 2.10 ඡේදය | වැඩ බැලීම හා පරිවාසික පත්වීම් ඇතුළුව සියළුම පත්වීම්, වැටුප් වර්ධක වෙනස්කම්, සේවයෙන් පහකිරීම්, ඉල්ලා අස්වීම් හා විශ්‍රාම ගැන්වීම්, නැවත සේවයේ පිහිටුවීම් හා මරණය යන මේවා පිලිබඳ සම්පූර්ණ විස්තර ඒ ඒ අවස්ථාවලදී විගණකාධිපතිට වාර්තා කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ලබා දෙන සියළු පත්වීම් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) 2015 අංක 05 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරී පනත | | | |
| (i) 64(1) වගන්තිය | සමාලෝචිත වර්ෂයේ ලියාපදිංචිය අළුත්කළ යුතු ඖෂධ 08 කට අදාල ලියකියවිලි ඖෂධ නියාමන අධිකාරියට නිසි කාලසීමාව තුළ ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත්කිරීමට දින 107ත් 219 ත් අතර පරාසයක කාල සීමාවක් ප්‍රමාද වී තිබුණි. | එවැනි ප්‍රමාදයන් වළක්වන ආකාරයට කළමනාකරණය කිරීමට පියවර ගෙන ඇති බව. | පනතේ විධිවිධානවලට අනුව කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) 64(2) වගන්තිය | ඖෂධ 07 ක ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අදාළ ගාස්තු ගෙවා තිබුණද අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් ඖෂධ නියාමන අධිකාරිය විසින් එම ඖෂධ සඳහා ලියාපදිංචිය අළුත් කිරීම ප්‍රමාද කර තිබුණි. | එවැනි ප්‍රමාදයන් වලක්වන ආකාරයට කළමනාකරණය කිරීමට පියවර ගෙන ඇති බව. | -එම- |
| (ඇ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ මෙහෙයුම් අත්පොතේ 5.3 ඡේදය | 2007 අංක 7 දරන සමාගම් පනතේ දක්වා ඇති පරිදි නුබුන්වත් භාවය පිළිබඳ පරික්ෂාවෙන් පසුව, බදු පසු ලාභයෙන් අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට බැර කරණු ඇතැයි අපේක්ෂා කර ඇති නමුත් 2023 වර්ෂයට අදාළ බදු පසු ලාභයෙන් සියයට 30 ක් වූ රු.455,566,592 ක් වෙනුවට රු.300,000,000 ක් පමණක් ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණි. | ආයතනයේ අවශ්‍ය අරමුදල් කළමනාකරණය කර ගනිමින් උපරිම වශයෙන් භාණ්ඩාගාරය වෙත ලබාදිය හැකි ප්‍රමාණය ඒකාබද්ධ අරමුදලට ලබා දීමට කටයුතු කර ඇති බව. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඉ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛයෙන් ප්‍රකාශිත රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ | | | |
| (i) 2.6 ඡේදය | අනුමත වූ කාර්ය මණ්ඩලය තුළ ඉහළ කළමනාකරණ මට්ටමේ සුදුසුකම් සහිත අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරයකු සිටිය යුතු වුවද සුදුසුකම් සහිත අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්වරයකු බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම තනතුරට අදාළ බඳවා ගැනීම් සිදු කිරීමට අවශ්‍ය පිරිවිතර සකස් කර, ලංසු කැඳවීම සඳහා ප්‍රසම්පාදන මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට යොමු කර ඇති බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ii) 3.2 ඡේදය ඇමුණුම 01 හි 2 කොටස (අ) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ එක් එක් ක්‍රියාකාරම සඳහා මූල්‍ය ඇස්තමේන්තුව සඳහන් කළ යුතු වුවද, මානව සම්පත් අංශයේ එක් එක් ක්‍රියාකාරකම් සඳහා ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්ම සඳහා එක් එක් ක්‍රියාකාරකම සඳහා මූල්‍ය ඇස්තමේන්තුව සඳහන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | -එම- |
| (iii) 4.3 ඡේදය | අවම වශයෙන් මාස 03 කට වරක් බැගින් අවදානම් කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ රැස්වීම් 02ක් පමණක් පවත්වා තිබුණි. | සමාලෝචිත වර්ෂයේ අවදානම් කමිටු රැස්වීම් 02 ක් පවත්වා ඇති අතර අදාල කාලය තුළ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කර නොතිබුණු බැවින් අවසාන කාර්තුවේ අවදානම් කමිටු රැස්වීම් පැවැත්වීමට නොහැකි වූ බව. | -එම- |
| (ඊ) 1997 පෙබරවාරි 03 දිනැති අංක 6/97 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2 වන ඡේදය. | වැඩ බැලීමේ කාලය මාස 3 ක උපරිමයකට යටත් විය යුතු වුවද, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි වට්ටෝරු හා පර්යේෂණ තනතුර සඳහා අඛණ්ඩව වර්ෂ 09 කට අධික කාලයක් වැඩ බැලීමේ පදනම මත නිලධාරියෙකු බඳවා ගෙන රු.1,541,368 ක වැඩ බැලීමේ දීමනාවක් ගෙවා තිබුණි. ඊට අමතරව 2022 දෙසැම්බර් 31 දින සිට පිළිවෙලින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත් හා අලෙවි තනතුරු 02 සඳහා වැඩ බැලීමේ පදනම මත නිලධාරිණියන් දෙදෙනෙකු පත් කර තිබුණි. | පිළිවෙලින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි මානව සම්පත්, වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන යන තනතුරු සඳහා අයදුම්පත් කැඳවීම සිදුකළද ඒ සඳහා සුදුසුකම් ලත් අයෙකු තෝරා ගැනීමට මේ දක්වාම නොහැකි වී ඇති බව හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී මූල්‍ය තනතුර සඳහා 2025මාර්තු 16 දින අයදුම්පත් කැඳවා ඇති බව. | අදාළ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කඩිනම් පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (උ) 2020 ඔක්තෝබර් 26 දිනැති කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 02/2020 VI ඡේදය | අනුමත කාර්ය මණ්ඩලයේ සේවකයින් විශ්‍රාම යැමේදී අදාළ පුරප්පාඩු පිරවීම සඳහා විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කළ යුතු වුවද සංස්ථාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ මානව සම්පත් කළමනාකරණ අධ්‍යනාංශයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් සිදු කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඌ) 2015 මැයි 15 දිනැති අංක මු.අ 01/2015/01 දරන චක්‍රලේඛයේ 3 ඡේදය (අ) හා 2023 මාර්තු 14 දිනැති සෞඛ්‍ය අමාත්‍යාංශ ජොෂ්ඨ සහකාර ලේකම් (පාලන) ගේ ලිපිය | නියම කරන ලද උපදෙස් වලින් බැහැරව අනියම් දීමනා හා සංයුක්ත දීමනා ලෙස වැඩිපුර ගෙවා තිබූ රු.1,689,108 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිළධාරින් කීප දෙනෙකුගෙන් මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇති බව. ඉතිරි නිළධාරින් අමාත්‍යාංශයේ ලේකම් වෙත අභියාචනයක් ඉදිරිපත් කර ඇති බව. | වැඩිපුර ගෙවන ලද මුදල් අයකරගැනීමට කටයුතු කළ යුතු අතර මෙම අක්‍රමිකතාවයට සම්බන්ධ පාර්ශවයන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (එ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 හා 4.2.2 මාර්ගෝපදේශය | අවම වශයෙන් වර්ෂ 03ක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන සැලැස්මක්ද සෑම ප්‍රසම්පාදනයක් ආරම්භයේ සිට අවසානය දක්වා වූ එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවර කාල ක්‍රමානුගතව විස්තර කරන ප්‍රසම්පාදන කාල සටහනක්ද පිළියෙල කර නොතිබුණි. | වර්තමානයේ සිදු කරන ප්‍රසම්පාදනයන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සහ කාල සටහන පිළියෙල කිරීම සිදු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඒ) 2015 ජූනි 04 දිනැති අංක BP/30/15 හා 2022 සැප්තැම්බර් 22 දිනැති අංක BP/62/22 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය | සංස්ථාවේ සේවකයින් සඳහා ගෙවනු ලබන පා පැදි ණය රු.20,000 සිට රු.75,000 දක්වා වැඩි කර තිබුණු නමුත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ලිඛිතව අනුමැතිය ඉල්ලා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යාක්‍ෂ ජනරාල් වෙත ලියා ඇති අතර ඉදිරියේදී අනුමැතිය ලබා දීමට බලාපොරොත්තු වන බව දන්වා ඇති බව. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ හා නීති රීති රෙගුලාසි අතර පරස්පරතා ඇති නොවන පරිදි කටයුතු කළ යුතුය. |
| (ඔ) සංස්ථාව සහ වෙනත් ඖෂධ නිෂ්පාදකයින් අතර බද්ධ ව්‍යාපාර සඳහා වූ ගිවිසුම | | | |

| | | | |
|---|---|---|---|
| (i) අංක 5.2.4 දරන වගන්තිය | ආයෝජකයන් විසින් ගිවිසුම් ගතවී මාස 03ක් ඇතුළත සිය නිෂ්පාදනාගාර ඉදිකිරීම් කටයුතු ආරම්භ කළ යුතු වුවද, ආයෝජකයින් 07 දෙනෙකු සම්බන්ධයෙන් අදාළ තොරතුරු පරීක්ෂාකර නොතිබුණි. | බද්ධ ව්‍යාපාර ඇති කර ගනු ලැබූ ආයෝජකයින්ගේ නිෂ්පාදනාගාර ඉදිකිරීමේ කටයුතු සම්බන්ධයෙන් නිරීක්ෂණය කරනු ලබන බව හා Green through ආයතනයේ ඉදිකිරීම් කටයුතු නිරීක්ෂණය කළ බව. | බද්ධ ව්‍යාපාර සඳහා වූ ගිවිසුම ප්‍රකාරව ඉතිරි ආයොජකයන්ගේ නිෂ්පාදනාගාරද පරික්ෂා කිරීමට කටයුතු කල යුතුය. |
| (ii) 3.16 වගන්තිය | මෙඩිකොම් බද්ධ ව්‍යාපාරය විසින් ඖෂධ අයිතම 16ක් නිෂ්පාදනය කර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත සැපයීමට නියමිතව තිබුණද සමාලෝචිත වර්ෂය තුළ කිසිම ඖෂධයක් සපයා නොතිබුණි. | 2022 වර්ෂයේ වෛද්‍ය සැපයුම් අංශයට අවශ්‍ය ඖෂධ නිසි පරිදි සැපයීමට නොහැකි වීම මත මෙඩිකොම් ආයතනයේ සැපයුම් කාර්ය සාධන මට්ටම ඉතා පහළ මට්ටමකට පත් වූ බැවින් ඔවුන්ගෙන් ඖෂධ මිලදී නොගත් බව. | බද්ධ ව්‍යාපාර සඳහා වූ ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුය. ගිවිසුම් කඩකිරීම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කල යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 2,156 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 1,518 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 638 ක එනම් සියයට 42 ක වර්ධනයක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයේ රු. මිලියන 800.9 ක් වූ අඩමාන ණය වෙන්කිරීම සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 4.8 ක් දක්වා පහළ බැසීමත්, රු. මිලියන 132 ක් වූ විකුණුම් වට්ටම් සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 78 ක් දක්වා පහළ බැසීමත් හේතුවෙන් විකුණුම් හා බෙදා හැරීමේ වියදම් සියයට 90.72 කින් අඩුවීමද, විදේශ විනිමය අලාභ අඩුවීම හේතුවෙන් මූල්‍ය වියදම් සියයට 56.48 කින් අඩු වීමද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දළ ලාභ හා ශුද්ධ ලාභ අනුපාතය පිළිවෙලින් සියයට 0.50 කින් හා සියයට 3.52 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයේ සියයට 16 ක් වූ ණයගැති පිරිවැටුම් අනුපාතය සමාලෝචිත වර්ෂයේ සියයට 17 දක්වා වැඩි වී තිබුණු අතර ණය අයකර ගැනීමේ කාලය දින 01 කින් අඩුවී වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 සිට මෙතෙක් ඉදිනොකළ සිව්මහල් පරිපාලන ගොඩනැගිල්ලක් වෙනුවෙන් වැය කර තිබුණු රු.27,550,136 ක් කෙරීගෙන යන වැඩ ගිණුමේ රු.73,582,498 ක ශේෂය තුළ වසර 7කට වඩා වැඩි කාලයක් පරිශේෂව පැවැති අතර එය අනාර්ථික වියදමක් වී තිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුමේ ඇතුලත් පරිපාලන ගොඩනැගිල්ල වෙනුවෙන් මේ වන තෙක් රු.27,550,136 ක් වැය කර ඇති අතර මෙම පරිපාලන ගොඩනැගිල්ල ඉදි කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් ඉහල කළමනාකරණය මගින් නිශ්චිත තීරණයක් ගෙන නොමැති බැවින් ඉදිරියේදී පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීමටද ඉඩ ප්‍රස්ථා ඇති අතර පරිපාලන ගොඩනැගිල්ල කෙරීගෙන යන වැඩ ගිණුම තුළ පවත්වා ගත යුතු බව. | සිව්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීම හා සම්බන්ධිත ඉකුත් ක්‍රියාවලිය පිළිබඳව විධිමත් පරීක්ෂණයක් හා ඇගයීමක් කිරීමට කටයුතු කල යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2018 වර්ෂයේ සිට 2024 දක්වා වෛද්‍ය සැපයීම් අංශයට සපයා ඇති බද්ධ ව්‍යාපාර ඖෂධ වලට අදාළව ඖෂධ මිල විචලනයන් හා සැපයීම් ප්‍රමාද ගාස්තු ලෙස රු.1,106,420,551 ක් වෛද්‍ය සැපයීම් අංශය විසින් සංස්ථාවෙන් අයකර ගෙන තිබුණද එම මුදල් අදාළ බද්ධ ව්‍යාපාර වලින් අයකර ගැනීමට කටයුතු නොකර දීර්ඝ කාලයක් තිස්සේ සංස්ථාවේ වෙළඳ ණයගැති වෛද්‍ය සැපයීම් ගිණුම්වල දක්වා තිබුණි. | මෙයට මූලික වශයෙන් හේතු වී ඇත්තේ පසුගිය වසර කිහිපයකට අදාල ගෙවීම් වවුචර වෛද්‍ය සැපයුම් අංශය මගින් මේ වන තුරුත් පියවීම් නොකිරීම බව. උදාහරණ වශයෙන් 2023 වර්ෂය වෙනුවෙන් රුපියල් බිලියන 19 ක පමණ ඉන්වොයිස් ප්‍රමාණයක් තව දුරටත් පියවීමට ඇති අතර එම පියවීම් නොකිරීම මත පරීක්ෂාවකින් තොරව අය කිරීම අපහසු බව. නමුත් මේ වන තෙක් ඇති අදාල අයකර ගැනීම් ප්‍රමාණයන් සඳහන් කර ලිපි යවා ඇති බව. එසේම 2024 වර්ෂයට අදාල ගෙවීම් වවුචර් සියයට 96ක්ම පියවා ඇති බව. | වෛද්‍ය සැපයුම් අංශයේ හා සංස්ථාවේ තොරතුරු අතර විධිමත් සැසඳුම් ක්‍රියාවලියක් සඳහා අවශ්‍යවන පාලන ක්‍රම හඳුන්වාදිය යුතු අතර මේ වන තුරුත් පියවීම් නොකළ අදාළ බද්ධ ව්‍යාපාර වලින් අය කර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2024 දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් වල ඇතුළත් පිරිවැය රු. 119,158,776 ක් වූ අයිතම 135ක් භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | 2024 වසරේ ස්ථාවර වත්කම් සමීක්ෂණයේදී භෞතිකව නොතිබුණු ස්ථාවර වත්කම් සැබෑ ලෙසම නොතිබී ඇත්දැයි නැවත පරීක්ෂාවට ලක්කල යුතු | අවසන් ගිණුම් පිළියෙල කිරීමට පෙර හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අතහැරීම්වලින් තොරව සියළුම වත්කම් භෞතිකව සත්‍යාපනය කිරීමට කටයුතු |

| | | |
|---|---|---|
| | අතර ඇතැම්විට ස්ථාවර වත්කම් අංක ගැලවී යාම හා ස්ථාවර වත්කම් නිසි ලෙස මාරු කිරීම යාවත්කාලීන නොකිරීම නිසාවෙන් සිදු වූ අතපසු වීමක් බව. වත්කම් හඳුනාගැනීමේ අංක ගැලවී නොයන ලෙස නව ක්‍රමවේදයක් භාවිතා කිරීමට සැලසුම් කරමින් සිටින බව හා ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගැනීමට කටයුතු කරන බව. | කල යුතුය. |
| (ඇ) ඖෂධ අමුද්‍රව්‍ය හුවමාරු ක්‍රමය යටතේ 2023 මාර්තු 03 දින සංස්ථාවෙන් බද්ධ ව්‍යාපාර වෙත රු.13,557,223 ක අමුද්‍රව්‍ය තොගයක් නිකුත්කර තිබුණද වසර දෙකකට වඩා වැඩි කාලයක් තිස්සේ අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී මුදල් හෝ ඖෂධ අමුද්‍රව්‍ය ලබා ගැනිමට කටයුතු කරන බව. | මුදල් අයකර ගැනීමට හෝ ඖෂධ අමුද්‍රව්‍ය ලබාගැනීමට කටයුතු කල යුතුය. |
| (ඈ) සංස්ථාව විසින් වෛද්‍ය සැපයීම් අංශය වෙත සපයා තිබුණු ඖෂධ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 16කදී මහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලැබී තිබුණු රු.මිලියන 25,780.89ක් අදාළ සැපයුම් ඉන්වොයිස් සමග සැසඳුම් කර නිවැරදිව හඳුනාගැනීමකින් තොරව ණයගැති ගිණුමට බැර කර තිබුණි. | 2024 වර්ෂයේ වෛද්‍ය සැපයීම් වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලද රු.25,780,890,000 ක සැපයුම් ඉන්වොයිස් වලට අදාල බිල්පත් නිරවුල් කිරීම නිවැරදිව ගිණුම් ගත කර ඇති බව. 2024 වර්ෂය සඳහා සියයට 96 ක් පමණ බිල්පත් නිරවුල් කිරිම් හඳුනාගෙන ඇති අතර ඉතිරි සුළු ප්‍රමාණයකට පමණක් බිල්පත් නිරවුල්කිරිම් ලැබී නොමැති බව. 2023 වර්ෂයේ රු.19,452,851,018 ක බිල්පත් තවමත් නිරවුල් කර නොමැති බව හා එම බිල්පත් නිරවුල් කර ගැනීමට දිගින් දිගටම වෛද්‍ය සැපයීම් අංශය සමඟ කටයුතු කරගෙන යමින් පවතින බව. | සැපයුම් ඉන්වොයිස් සමග සැසඳුම් කර නිවැරදිව හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. සැසඳුම් ක්‍රියාවලිය වේගවත් කිරීමට අවශ්‍ය විධිමත් යාන්ත්‍රණයක් සකස් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඉ) පර්යේෂණ හා සංවර්ධනය අංශය විසින් සංවර්ධනය කළ ඖෂධ වෙළඳ පොලේ අධික ඉල්ලුමක් සහිත ඖෂධ වර්ග 08ක්, වාණිජ්‍ය නිෂ්පාදන වශයෙන් ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය සඳහා 2023 දී ඉදිරිපත් කර තිබුණද, ඒ සමග ඉදිරිපත් කළ යුතු ලියවිලි නිසි පරිදි | ඖෂධ 08 න් එක් ඖෂධයක් සඳහා 2025 වර්ෂයේදී ජාතික ඖෂධ නියාමන අධිකාරියේ අනුමැතිය ලැබී ඇති බව. ඉතිරි ඖෂධයන් 07 න් කිහිපයක ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන ලියකියවිලි ඉදිරිපත් කර ඇති බව හා ඉතිරි ඖෂධයන්හි | ලියාපදිංචිය අළුත් කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාවලිය නිවැරදිව හා කාලීනව පවත්වාගෙන යාම සඳහා සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දීමට කටයුතු කළ යුතු අතර ප්‍රමාදයන් සම්බන්ධයෙන් වගකිවයුතු නිළධාරීන්ට |

| | | | |
|---|---|---|---|
| | ඉදිරිපත් නොකිරීම නිසා වර්ෂ 1½ කටත් අධික කාලයක සිට එම වාණිජ්‍ය නිෂ්පාදන වෙනුවෙන් අනුමැතිය ලැබී නොතිබුණි. | ලියාපදිංචිය සඳහා අවශ්‍ය වන ලියකියවිලි සංස්ථාව විසින් තවමත් සකස් කරමින් පවතින බව. | එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ඊ) | Mebendazole Tab USP 100 mg හා Flucloxacillin Capsule BP 500 mg යන ඖෂධවල ලියාපදිංචි සහතික පිළිවෙලින් 2024 දෙසැම්බර් 16 දින හා 2024 දෙසැම්බර් 17 දින කල් ඉකුත් වී තිබීමත් සංස්ථාව විසින් නියමිත දින වලට එම සහතික නැවත අළුත් කර ගැනීමට කටයුතු නොකිරීමත් Flucloxacillin Capsule BP 500 mg 2025 ජනවාරි 29 දින හා Mebendazole Tab USP 100 mg 2025 පෙබරවාරි 01 දින නැවත ජාතික ඖෂධ නියාමන අධිකාරිය විසින් ලියාපදිංචිය අළුත් කිරීමත් හේතුවෙන් වෛද්‍ය සැපයීම් අංශයෙන් ඉල්ලුම් කරන ලද අදාළ ඖෂධ ඇණවුම් වෙනුවෙන් ඖෂධ සැපයීමට සංස්ථාවට නොහැකි වී තිබුණි. ඒ අනුව 2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු. 26,177,276 ක් වූ ඖෂධ සංස්ථාවේ වෛද්‍ය සැපයීම් අංශ ගබඩාව තුළ ඉතිරිව තිබුණි. | ඖෂධයන්හි ලියාපදිංචිය ප්‍රමාද වූ නිසාවෙන් 2024 දෙසැම්බර් මාසයේ ලබා දීමට නොහැකි වූ ඇණවුම් ප්‍රමාණය 2025 ජනවාරි වන විට ලබා දීමට හැකි වූ බව. | -එම- |
| (උ) | Clopidogrel Tablets USP 75 mg (500 Pack Size) ඖෂධය නව ඖෂධයක් ලෙස සංස්ථාව තුළ නිපදවීම සඳහා 2020 වර්ෂයේ හඳුන්වා දී තිබුණද එහි නිෂ්පාදන සූත්‍රයෙහි පවතින දුර්වලතාවයන් හේතුවෙන් නිපදවීම අසාර්ථක වී තිබුණි. නිෂ්පාදන සූත්‍රය සංවර්ධනය කර මෙම ඖෂධය සංස්ථාව තුළ නිපදවා වෛද්‍ය සැපයීම් අංශයේ අවශ්‍යතා වෙනුවෙන් සැපයුම් සිදු කලේ නම් සියයට 10ක ලාභයක් ළඟා කර ගැනීමට අවස්ථාව තිබුණද සංස්ථාව එසේ කටයුතු නොකර බද්ධ ව්‍යාපාර හරහා සියයට 6ක ලාභයක් සහිතව ඇසුරුම් 1700ක් පමණක් සපයා තිබුණි. | Clopidogrel Tablets USP 75 mg ඖෂධයේ සූත්‍රය සංවර්ධනය කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | නිෂ්පාදන සූත්‍රයේ පවතින දුර්වලතා සංවර්ධනය කර ඖෂධය නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඌ) | 2023 වර්ෂයේදී පෙනිසිලින් කලාපය පුළුල් කිරීම ප්‍රතිසංස්කරණය හා ඖෂධීය උපකරණ මිලදී ගැනීම සඳහා ලෝක බැංකු ආධාර යටතේ රු. 438,146,336 ක් ලැබී තිබූ අතර | පෙනිසිලීන් කලාපය තුල නව ප්‍රතිජීවක නිෂ්පාදනය කිරීම තව දුරටත් අධ්‍යයනය කිරීමට සිදු වන බව හා Co – Amoxiclav ඖෂධය නිෂ්පාදනය සඳහා | ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවීම සම්බන්ධයෙන් පසු විපරමක් සිදුකර අවශ්‍ය නිවැරදි කිරීම් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සංස්ථාවද ඒ වෙනුවෙන් රු.24,895,256 ක පිරිවැයක් දරා තිබුණි. මෙහිදී අධිවේගී කරල් පිරවුම් යන්ත්‍ර හා අනෙකුත් නිෂ්පාදන යන්ත්‍ර උපකරණ පෙනිසිලින් කලාපයට මිලදී ගැනීම තුළින් යන්ත්‍රාගාරයේ නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීමටද, Co-Amoxiclav පෙති වැනි නව නිෂ්පාදන සඳහා නව අඩු ආර්ද්‍රතා ප්‍රදේශයක් සංවර්ධනය කිරීමටද, අපේක්ෂා කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පෙනිසිලින් කලාපය තුළ දැනට නිෂ්පාදනය කරමින් පවතින පෙනිසිලින් කරල් වර්ග පහකින් මිලියන 261ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද, කරල් මිලියන 191ක් පමණක් නිෂ්පාදනය කිරීමට හැකි වී තිබුණු අතර 2019 වර්ෂයේදී කරල් මිලියන 275ක් නිෂ්පාදනය කර තිබුණි. ඒ අනුව පෙනිසිලින් කලාපය වැඩි දියුණු කළද සැලකිය යුතු ප්‍රගතියක් අත්පත් කරගැනීමට සමත් වී නොතිබුණි. | ඉදිරියේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | |
| (එ) | සමාලෝචිත වර්ෂයේ නිෂ්පාදන සැලැස්ම අනුව Metformin BP 500 mg ඖෂධයෙන් ඒකක මිලියන 84ක් නිපදවීමට අපේක්ෂා කළද ඒකක මිලියන 9.28ක් පමණක් නිෂ්පාදනය කර පෞද්ගලික වෙළඳපොල වෙත නිකුත් කර තිබුණි.මෙම ඖෂධය සංස්ථාව තුළ නිෂ්පාදනය කිරීම මගින් සියයට 12ක ලාභයක් ඉපයීමට හැකියාව තිබුණ ද වෛද්‍ය සැපයීම් අංශයෙන් 2024/SPM/N/R/P/00015 දරණ ඇණවුම යටතේ ලැබුණු රු මිලියන 50ක ඇණවුමක් සැන්ඩ්ස් ඇක්ටිව් බද්ධ ව්‍යාපාරය වෙත ලබාදී සියයට 06 ක ලාභයක් පමණක් උපයාගෙන තිබුණි. තවද, ඖෂධ ඒකක මිලියන 250ක් සපයාගැනීම වෙනුවෙන් වූ වෛද්‍ය සැපයීම් අංශයේ 2024/SPM/N/R/P/00015 දරණ ඖෂධ ඇණවුම සංස්ථාවට හා සංස්ථාවේ බද්ධ ව්‍යාපාර වන සෙලොජන් ලංකා සමාගම වෙත හා සැන්ඩ්ස් ඇක්ටිව් සමාගම වෙත ලබාදී තිබූ අතර සෙලොජන් ලංකා | 2024 වර්ෂයට අදාල දඩ මුදල් එම ආයතන වලින් අය කර ගැනීමට කටයුතු කරමින් සිටින බව. | නිසි ශක්‍යතා අධ්‍යයනයන් සහිතව නිෂ්පාදන සැලැස්ම පිළියෙල කළ යුතු අතර වඩාත් වාසිදායක විකල්ප ක්‍රම අනුගමනය කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාගම නියමිත කාල රාමුව තුළ ඖෂධ නොසැපයීම හේතුවෙන් රු. 12,311,005ක දඩ මුදලක් වෛද්‍ය සැපයීම් අංශයට ගෙවීමට සංස්ථාවට සිදුවී තිබුණි. එසේ වුවද අදාල දඩ මුදල් සෙලොජන් ලංකා සමාගමෙන් අයකර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි. | | |
| (ඒ) | සමාලෝචිත වර්ෂයේ අලෙවි සැලැස්ම, නිෂ්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඉහළ වෙළඳපොළ ඉල්ලුමක් ඇති Rosuvastatin Tablets IP 10 mg ඖෂධය නිෂ්පාදනයට, අලෙවියට හා අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සැලසුම් කර නොතිබුණි. තවද, එම ඖෂධයට අදාළව 2023 මාර්තු 21 දින ලැබුණු රු.12,991,560ක් පිරිවැය වූ ඖෂධ අමුද්‍රව්‍ය කි.ග්‍රෑ.75 ක් 2024 ජුනි මාසය දක්වා නිෂ්පාදනයට භාවිතා කර නොතිබුණු අතර එම අමුද්‍රව්‍යවල ගුණාත්මකභාවය පිළිබඳව පරීක්ෂා කර ඒවා IP පිරිවිතර හා එකඟ නොවන බවට සංස්ථාවේ තත්ත්ව පාලන අංශයෙන් තහවුරු කර තිබුණද එම පරීක්ෂාවද වසරකට පසු එනම් 2024 ජුනි 24 දින සිදුකර තිබුණි. කෙසේ වුවද අදාළ තොගය ආපසු යවා ඒ වෙනුවට සැපයුම්කරුගෙන් යෝග්‍ය අමුද්‍රව්‍ය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | තොගය නැවත ප්‍රතිස්ථාපනය කරදීමට සැපයුම්කරු එකඟ වී ඇති අතර අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව. මෙම ක්‍රියාවලියෙහි අවසාන අදියර ලෙස සැපයුම්කරුගේ රටෙහි රේගු නිෂ්කාශනයට අදාළ අනුමැතීන් ලබා ගනිමින් පවතින බව. | ඉල්ලුම, නිෂ්පාදන කාල රාමුව හා හැකියාව ඖෂධය නිෂ්පාදනය සඳහා පවතින තාක්ෂණික ශක්‍යතාව යනාදී කරුණු සැලකිල්ලට ගෙන පිළියෙල කරන අලෙවි, නිෂ්පාදන හා ප්‍රසම්පාදන සැලැස්මට අනුව අමුද්‍රව්‍ය මිලදීගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඔ) | Aspirin AR Tablets 75 mg ඖෂධයේ තාක්ෂණික දෝෂ පැවතියද ඒ පිළිබඳව නොසලකා 2022 හා 2023 වර්ෂය තුළ මිලදී ගෙන තිබුණු. 1,786,398ක් පිරිවැය වූ Aspirin AR ඖෂධ අමුද්‍රව්‍ය කි.ග්‍රෑ. 641ක් ඌන උපයෝජිතව ගබඩාවේ පැවතුණි. | Aspirin AR Tablets 2022 සැප්තැම්බර් මාසයේ 300kg ද 2023 අප්‍රේල් මාසයේ 500kg ද ප්‍රසම්පාදනය කර ඇති බව. 2023 වසරේදී lot 3ක් නිෂ්පාදනය කර ඇති අතර bulk pack වලට පවතින ඉල්ලුම අඩු නිසා blister pack කරන තුරු නිෂ්පාදන කටයුතු තාවකාලිකව නවතා ඇති බව. පසුව කරන ලද පර්යේෂණ lot 2024 BP පිරිවිතරයන්ට අනුකූල නොවන නිසා නිෂ්පාදන කටයුතු ප්‍රමාද වීම මත දැනට ඉතිරි වී ඇති | ඖෂධ අමුද්‍රව්‍ය කල් ඉකුත් වීමට පෙර භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | aspirin අමුද්‍රව්‍ය ඖෂධ නිෂ්පාදකයෙකු හට ලබාදීමේ හැකියාව සොයාබලමින් පවතින බව. | |
| (ඕ) 2020 වර්ෂයේදී කොවිඩ් – 19 වසංගතයට භාවිතා කිරීමේ අපේක්ෂාවෙන් මිලදීගෙන තිබුණු 2025 මාර්තු 31 දිනට කල්පිරීමට නියමිත රු. 6,698,610ක් පිරිවැය වූ Chloroquine Phosphate BP අමුද්‍රව්‍ය කි. ග්‍රෑ. 600ක් සමාලෝචිත වර්ෂයේ ද නිෂ්කාර්යව ගබඩා පරිශ්‍රය තුළ පැවති නමුත්, එම අමුද්‍රව්‍ය සැපයුම්කරුට ප්‍රතිඅපනයනය කිරීමට හෝ වෙනත් පාර්ශවයකට අලෙවි කිරීමට කටයුතු කර නොතිබුණි. | Chloroquine Phosphate BP 250mg යන ඖෂධය කොවිඩ්-19 වසංගතය සඳහා භාවිතා කිරීමට නිර්දේශ වූ අතර ඒ වන විට පැවති අමුද්‍රව්‍ය තොගය භාවිත කරමින් ඉතා කෙටි කාලයක් ඇතුළත Chloroquine Phosphate BP 250mg පෙති මිලියන පහක ප්‍රමාණයක් නිෂ්පාදනය කර රටේ අවශ්‍යතාවය සඳහා භාවිතා කිරීමට වෛද්‍ය සැපයුම් අංශය වෙත ලබා දීමට හැකි වූ බව. නමුත් බලාපොරොත්තු වූ ආකාරයට ඖෂධය භාවිතා නොවීම නිසා මෙම අමුද්‍රව්‍ය තොගය ඉතිරි වූ බව. | අමුද්‍රව්‍ය නැවත පරීක්ෂා කර භාවිතයට ගැනීමට හෝ සැපයුම්කරුට ප්‍රති අපනයනය කිරීමට හෝ වෙනත් පාර්ශවයකට ප්‍රති අපනයනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ක) 2018 සිට 2024 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ නව ඖෂධ වර්ග 29 ක් පමණ හඳුන්වා දුන්නද ඉහළ ඉල්ලුමක් ඇති ඖෂධ කිහිපයක් හැර අළුතින් හඳුන්වා දුන් ඖෂධ අඛණ්ඩව නිෂ්පාදනයට සහ ප්‍රවර්ධනයට ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබීම හේතුවෙන් සංස්ථාවේ නිෂ්පාදන මිශ්‍රණය සඳහා එම හඳුන්වාදීම් වලින් ප්‍රමාණවත් දායකත්වයක් සිදු වී නොතිබුණි. | මෙම කාල පරිච්ඡේදය තුළ හඳුන්වා දෙන ලද නව ඖෂධ අතරින් සමහර ඖෂධ වෛද්‍ය සැපයුම් අංශයේ අවශ්‍යතාව සඳහා පමණක් නිෂ්පාදනය කරනු ලබන අතර පුද්ගලික වෙළඳපලේ මෙම ඖෂධ සඳහා ඉල්ලුමක් නොමැති බව. Rosuvastatin Tablets 5mg, Sitagliptine Tablets 50mg, Loratadine Tablets 10mg, Cetirizine Tablets 10mg, Losartan Potassium Tablets BP 25 mg, Mefenamic acid Tablets BP 500 mg වැනි ඖෂධ සඳහා පුද්ගලික වෙළඳපල ඉල්ලුම blister ඇසුරුම් සඳහා වන අතර දැනට අප සතු blister ඇසුරුම් යන්ත්‍ර මේ සඳහා ප්‍රමාණවත් නොවන හෙයින් මෙම අයිතමයන් සඳහා පවතින වෙළඳපල ඉල්ලුම සැපයීමට නොහැකි වී ඇති බව. | වෛද්‍ය සැපයීම් අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේද ඉල්ලුමක් ඇති නව ඖෂධ නිෂ්පාදන මිශ්‍රයට එක් කිරීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ග) | වර්ග අඩි 18,439 පමණ වපසරියකින් යුත් සංස්ථාව සතු බුලත්සිංහල පිහිටි සිව් මහල් ගොඩනැගිල්ලේ වර්ග අඩි 3,762 පමණ වන බිම් මහල පමණක් සංස්ථාවේ ගබඩා කටයුතු වෙනුවෙන් උපයෝජනය කර තිබුණද, වර්ග අඩි 10,837 ක පමණ වපසරියකින් යුත් මහල් 3 ක් ප්‍රශස්ත භාවිතයකින් තොරව නිෂ්කාර්යව තිබුණි. තවද ගොඩනැගිල්ල තුළ පොදු පරීක්ෂණ රසායනාගාරයක් සහ පුහුණු පාසලක් ස්ථාපිත කිරීමේ අරමුණින් ලබාගත් ශ්‍රවනාගාර පුටු 30 ක් හා ආලින්ද පුටු 10 ක් වසර 05 ක කාලයක සිට උපයෝජනය කර නොතිබුණු අතර එම භාණ්ඩ විනාශ වෙමින් පැවතුණි. | සැලකිල්ලට ගන්නා ලද බව. එම පුටු රජයේ විශ්ව විද්‍යාලයකට ලබා දීමට තීරණය කර ඇති අතර ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදු කරගෙන යනු ලබන බව. මෙම ගොඩනැගිල්ල වර්තමානයේ තාවකාලිකව ගබඩාවක් වශයෙන් භාවිතා කරනු ලබන බව. | ගොඩනැගිල්ල මිලදී ගැනීම සඳහා වැය කළ මුදලට සාපේක්ෂව උපරිම ප්‍රතිලාභ ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ච) | රු.104,844,337 ක් වටිනා Amoxicillin (AA003) ඖෂධ අමුද්‍රව්‍ය කි. ග්‍රෑ. 9000ක් 2024 මාර්තු 01 දින ප්‍රතික්ෂේප කර තිබුණු අතර 2025 පෙබරවාරි 27 දින කි. ග්‍රෑ. 4500 හා 2024 දෙසැම්බර් 18 දින කි. ග්‍රෑ. 4500ක් වශයෙන් අවස්ථා 02කදී ඒ වෙනුවට වෙනත් තොග නැවත ලැබී තිබුණද මේ දක්වාම ප්‍රතික්ෂේපිත තොගය අදාළ ගබඩාවල තබා ගනිමින් ඒ සඳහා අමතර ගබඩා පිරිවැයක් දරා තිබුණි. | ගබඩා සඳහා ගෙවූ මුදල සැපයුම්කරුගෙන් හා බැඳුම්කරයෙන් අය කිරීමට පියවර ගෙන ඇති බව. | තත්ත්ව පරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් හා කඩිනම් කළ යුතු අතර අමතර ගබඩා පිරිවැය අවම කිරීම සඳහා ප්‍රතික්ෂේපිත තොග වහාම සැපයුම්කරුවන් වෙත ආපසු යැවීමට පියවර ගත යුතුය. |

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වෛද්‍ය සැපයීම් අංශයෙන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව වෙත Tramadol Hydrochloride Capsule 50 mg ඖෂධ කරල් මිලියන 7.5 ක් මිලදී ගැනීම සඳහා 2023 සැප්තැම්බර් 06 දින 2024/SPM/N/R/P/00029 දරණ ඇණවුම ලබා දී තිබුණි. ඒ අනුව 2024 ජනවාරි 06 හා 2024 මැයි 06 යන දිනවල පිළිවෙලින් ඖෂධ කරල් මිලියන 4ක් හා මිලියන 3.5ක් බැගින් නියමිත කාල රාමුව තුළ සැපයීම් කළ යුතු වුවද 2024 වර්ෂය තුළ අදාළ ඇණවුම වෙනුවෙන් ඖෂධ කරල් මිලියන 5.256ක් පමණක් සපයා තිබූ | ප්‍රමාද වී සැපයුම් කිරීම මගින් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවට දඩ මුදල් ගෙවීමට සිදුවීම සංස්ථාවට අවාසිදායක වන බව සත්‍ය නමුත් ඇණවුම් ලබාදීමේදී ඒවායෙහි සැපයුම් කාලරාමුව මාසික හා සාධාරණ පදනමකට ලබා දෙන ලෙස වෛද්‍ය සැපයුම් අංශයෙන් ඉල්ලා ඇති බව. සංස්ථාවේ සියළු අංශයන්හි සාමූහික වගකීමක් සේ සලකා මෙම ඇණවුම් අදාළ කාල රාමු තුළදීම සැපයීමට අපේක්ෂා කරන බව. | නියමිත කාල රාමුව තුළ ඖෂධ සැපයීමට හැකිවන පරිදි අවශ්‍ය පාලන ක්‍රම ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අතර ප්‍රමාද වී ඖෂධ සැපයීම හේතුවෙන් බිල්පත් 5ක් වෙනුවෙන් වෛද්‍ය සැපයීම් අංශයට රු. මිලියන 1.298ක ප්‍රමාද ගාස්තුවක් ද ගෙවීමට සිදුවී තිබුණි. තවද සංස්ථාවේ අලෙවි සැලැස්මට අනුව ඖෂධයෙන් ඒකක මිලියන 7.5ක් අලෙවි කිරීම තුළින් රු. මිලියන 118.57ක අලෙවි ආදායමක් ලබාගැනීමට අපේක්ෂා කළද සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 60.175ක අලෙවි ආදායමක් පමණක් උපයාගෙන තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂය සඳහා වූ නිෂ්පාදන සැලැස්ම අනුව අයවැයගත නිෂ්පාදනය ඖෂධ ඒකක මිලියන 4,020ක් වූ අතර සත්‍ය නිෂ්පාදනය ඖෂධ ඒකක මිලියන 3,146.54ක් වීමෙන් අහිතකර විචලනය ඖෂධ ඒකක මිලියන 874.3 ක් වී තිබුණි.මෙය ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ඖෂධ ඒකක මිලියන 381.08කින් ඖෂධ නිෂ්පාදනය අඩුවීමකි. | 2024 වර්ෂයේදී ලෝක බැංකු ආධාර යටතේ පෙනිසිලින් අංශයේ ගොඩනැගිල්ල හා යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු සඳහා මාස කිහිපයක් වසා තැබූ බව. 2024 දී නිෂ්පාදනය අංශයේ පුහුණු සේවකයන් 12 දෙනෙකු සේවයෙන් ඉවත් වූ බව, අමුද්‍රව්‍ය හිඟය, තාක්ෂණික කරුණු. Levothyroxine Tablets 50 mcg සඳහා ලැබුණු ඇණවුම් අඩුවූ බව. ඉල්ලුම වැඩි සමහර ඖෂධ වර්ග 2023 වර්ෂයට සාපේක්ෂව වැඩියෙන් නිපදවූ බව. 2023 දී නිපදවූ පෙති මිලියන 3559.92 සංස්ථා ඉතිහාසයේ වසරකට නිපදවන ලද වැඩිම ඖෂධ ප්‍රමාණය බව. 2018 දී JICA ආධාර යටතේ ඖෂධාගාරය වැඩි දියුණු කිරීමේදී වාර්ෂික නිෂ්පාදන ධාරිතාව මිලියන 3200 පමණ ලෙස දැක්වූ බව. එබැවින් මිලියන 4020 ක ඉලක්කයක් යනු දැනට පවතින තත්තවයන් යටතේ ලඟාවීමට ඉතා අපහසු ඉලක්කයක් වන අතර 2023 වසර අවසානයේ පැවති තත්ත්වය පදනම්ව මෙම ඉලක්කය තීරණය වූ බව. | ළඟා කර ගත හැකි ඉලක්කම පදනම් කරගෙන සැලසුම් සකස් කළ යුතුය. ඉහළ ඉලක්ක කරා ලඟාවීමට හැකි පරිදි මෙහෙයුම් කටයුතු සිදු කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේදී Paracetamol ඖෂධය Pacidol යන වෙළඳනාමය යටතේ වෙළඳපොලට හඳුන්වා දී තිබුණු අතර මෙම ඖෂධයෙන් සමාලෝචිත වර්ෂයේ ඇසුරුම් ඒකක 720,000 ක් | SPMC Pacidol අයිතමය සඳහා වෙළඳපොල පවතින ඉල්ලුම මත 2024 වර්ෂය සඳහා අලෙවි කිරීමට ඇසුරුම් ඒකක 720,000 ඇස්තමේන්තු කරන ලද බව. | අපේක්ෂිත ඉලක්කය සපුරා ගැනීමට ආයතනයේ සියළුම අංශ සක්‍රිය දායකත්වය ලබාදිය යුතු වුවද ඇස්තමේන්තු අගයෙන් සියයට 16ක් තරම් වූ |

| | | |
|---|---|---|
| අලෙවි කර රු. 178,200,000ක් උපයා ගැනීමට සැලසුම් කර තිබුණි. බෙහෙත් වට්ටෝරු අවශ්‍ය නොවන ඉහළ වෙළඳපොල ඉල්ලුමක් පවතින මෙම ඖෂධයේ වෙළඳනාමය ප්‍රවර්ධනය කිරීම සඳහාද ප්‍රවර්ධන වියදම් දරා තිබුණද සැලසුම් කළ පරිදි නිෂ්පාදනය සිදුනොවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලෙවිකර තිබුණු ප්‍රමාණය Pacidol ඇසුරුම් ඒකක 114,150ක් වූ අතර ඉන් උපයාගෙන තිබුණු ආදායම රු. 30,513,176ක් පමණක් විය. | මෙම Pacidol අයිතමය Blister ඇසුරුම් කරනු ලබන යන්ත්‍රයේ තවත් අයිතම 08ක් පමණ ඇසුරුම් කරනු ලබන බැවින්, 2024 වර්ෂය තුළ Pacidol අයිතමයෙන් ඇසුරුම් කර වෙළඳපොලට අලෙවිය සඳහා ලැබී ඇත්තේ ඇසුරුම් ඒකක 114,150ක් බව. එම සම්පූර්ණ ප්‍රමාණය වර්ෂය තුළ අලෙවි කර ඇති අතර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ ප්‍රවර්ධන කටයුතු සඳහා SPMC නිෂ්පාදන මිශ්‍රයෙහි ඇති OTC ඖෂධයන් වන Pacidol ඖෂධයෙහි නාමය බොහෝවිට භාවිතා කරනු ලබන අතර මෙය හුදෙක්ම Pacidol ප්‍රවර්ධනය සඳහා නොවන අතර SPMC නාමය (Image) ප්‍රවර්ධනය කිරීමද සිදු වන බව. | ඉතා කුඩා ප්‍රතිශතයක් පමණක් ආයතනය අත්පත් කරගෙන තිබීම කිසිසේත්ම ප්‍රමාණවත් නොවන අතර සැමවිටම වෙළඳපොල ඉල්ලීම මත නිෂ්පාදන ප්‍රමුඛතාවය ලබාදීම සම්බන්ධයෙන් ආයතනයේ අංශ අවධානය යොමු කල යුතුය. |
| (ඇ) Ciprofloxacin Tablets USP 500 mg ඖෂධයෙන් 2024 ජනවාරි සිට ඔක්තෝබර් දක්වා දේශීය වෙළඳපොළට ඖෂධ ඒකක මිලියන 32.81ක් ඉල්ලීම් කර තිබුණද ඖෂධ ඒකක මිලියන 2.36ක් වැනි ඉතා කුඩා ප්‍රමාණයක් සැපයීම් කර තිබුණි. සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ අලෙවි සැලැස්මට අනුව පිළිවෙලින් එම ඖෂධ ඒකක මිලියන 13.5 ක් හා 13.2ක් අලෙවි කිරීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ කිසිදු ඒකකයක් නිෂ්පාදනය කර නොතිබුණි. දේශීය වෙළඳපොළේ ඉහළ ඉල්ලුමක් සහිත Ciprofloxacin Tab USP 250 mg හා 500 mg ඖෂධ නිෂ්පාදනය කිරීමට Ciprofloxacin HCL USP ඖෂධ අමුද්‍රව්‍ය විශාල වශයෙන් ගබඩාවේ පැවතියද නියමිත කාලසීමාව තුළ නිෂ්පාදනය කිරීමට නොහැකිවීම නිසා සංස්ථාවට ලැබීමට තිබූ ඉහළ ආදායමක් අහිමි වී තිබුණි. | අමුද්‍රව්‍ය 2025 මුල් මාස දෙක තුලදී භාවිතා කර Ciprofloxacin 250 mg 7.5 million හා Ciprofloxacin 500 mg 3.6 million නිපදවන ලද බව. මෙම ඖෂධ නිපදවීම තාක්ෂණික වශයෙන් ඉතා අසීරු අතර එම කර්තව්‍යය සඳහා සහභාගී කර ගත්තේ පළපුරුදු සේවකයන් කිහිප දෙනෙකු පමණක් බව. නැතහොත් මෙම පෙති යන්ත්‍රයේ ඇලීම, කැඩී යාම වැනි හේතු නිසා නිෂ්පාදන කටයුතු සඳහා වැඩි කාලයක්, ශ්‍රමයක් වැයවන අතර ප්‍රතිනිෂ්පාදන සම්භාවිතාවයද වැඩි බව. 2024 වර්ෂයේදී පුහුණු සේවකයන් 12 දෙනෙකු ඉවත්ව යාම නිසා ඇතිවූ පුරප්පාඩුව හේතුවෙන් කුමන ඖෂධ සඳහා ප්‍රමුඛතාවය දෙන්නේද යන්න තීරණයක් ගත යුතුව තිබුණු බව. | පෞද්ගලික වෙළඳපොල මෙන්ම වෛද්‍ය සැපයීම් අංශයේද ඉල්ලුමක් ඇති ඖෂධයක් බැවින් ඖෂධ නිෂ්පාදනය ඉහළ නැංවීමට ප්‍රමුඛතාවයක් දී කටයුතු කළ යුතුය. අදාළ මානව සම්පත් ගැටළු විසඳා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

### 3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සංස්ථාවේ තත්ත්ව පාලන රසායනාගාරයේ සිවිලිම සැපයීම හා ස්ථාපනය කිරීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 වගන්තිය ප්‍රකාරව ප්‍රසම්පාදනයට අදාල මුළු පිරිවැය ඇස්තමේන්තුව පිළියෙල කළ යුතු බවත් 4.3.2 වගන්තිය ප්‍රකාරව එම මුළු පිරිවැය ඇස්තමේන්තුව දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කළ යුතු බවත් දක්වා තිබුණද මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. | මූලික ව්‍යාපෘතියට අමතරව සිදු කරන ලද අනු ව්‍යාපෘතීන් එක් විෂය පථයක් ලෙස ගෙන කරගෙන යාම අපහසු කටයුත්තක් වූ අතර එක් එක් සේවා සපයන්නන් විවිධ බව. ඒ අනුව මෙහිදී වෙනස්වූ සේවාවන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම කෙටි කාලීනව සිදුකිරීම ප්‍රායෝගිකව පහසු කාර්යයක් නොවන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1 (ඇ) ප්‍රකාරව ප්‍රසම්පාදනයට අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කර ඇති බවට ස්ථිර බැඳීමකින් තොරව ප්‍රසම්පාදන ක්‍රියාවක් ආරම්භ නොකළ යුතු වුවද යථෝක්ත ප්‍රසම්පාදනයට අවශ්‍ය රු.මිලියන 5න් රු.මිලියන 03ක් 2024 වාර්ෂික අයවැයෙන් වෙන්කර තිබුණු නමුත් ඉතිරි රු.මිලියන 2 ක ලබාගැනීමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කළ 2024 පෙබරවාරි 02 දින දක්වාම මූල්‍ය අංශයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මෙම මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය දැනට පවතින නවීනම අංගයන්ගෙන් සමන්විත එවකට රු.මිලියන 35 ක් පමණ වටිනා වායු සමීකරණ පද්ධතියක්වූ අතර එය සියළු පාර්ශවයන්ගේ අන්‍යෝන්‍ය සුහදතාවය සහ අවබෝධය මත පදනම්ව සම්පූර්ණයෙන්ම නොමිලේ සිදු කරන ලද පරිත්‍යාගයක් බව. මූලික ව්‍යාපෘතියට අමතරව සිදු කරන ලද අනු ව්‍යාපෘතීන් එක් විෂය පථයක් ලෙස ගෙන කරගෙන යාම අපහසු කටයුත්තක් වූ අතර එක් එක් සේවා සපයන්නන් විවිධ වූ බව. ඒ අනුව මෙහිදී වෙනස්වූ සේවාවන් සඳහා මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කිරීම කෙටි කාලීනව සිදුකිරීම ප්‍රායෝගිකව පහසු කාර්යයක් නොවන බව. | -එම- |
| (iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව සියයට 05ක කාර්ය සාධන සුරක්ෂණයක් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් වී තවත් දින 28ක් ඔබ්බට වලංගු වන අයුරින් කොන්ත්‍රාත්කරුගෙන් ලබාගත යුතු වුවද කාර්ය සාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි. | අනු ව්‍යාපෘතීන් හදිසි කටයුත්තක් ලෙස සිදුවූ බැවින්, මූල්‍ය ඌනතාව සඳහා මූල්‍ය අංශයේ අනුමැතිය ලබා ගැනීම සහ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සමගාමීව සිදු කර ඇති බව. | -එම- |

| | | |
|---|---|---|
| (iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12.2 වගන්තිය අනුව සමාන කොන්ත්‍රාත් පිළිබඳව ලංසුකරුවන්ගේ පළපුරුද්ද සහ අතීත කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ලංසුකරුවන්ගෙන් ලබාගත යුතු බවට දක්වා තිබුණද, එම තොරතුරු තෝරාගත් ලංසුකරුගෙන් ලබාගෙන නොතිබුණු අතර එම ව්‍යාපාරය ආරම්භ කළ 2022 දෙසැම්බර් 24 දින සිට වසරක පමණ කාලයක් සඳහා වූ බැංකු ගිණුමක විස්තර පමණක් ඉදිරිපත් කර තිබුණි. | ප්‍රදානය කිරීමේ ලිපිය 2024 පෙබරවාරි 02 දින යොමු කරන ලද අතර සම්පූර්ණ ව්‍යාපෘතිය 2024 පෙබරවාරි 08 දිනට පෙර නිම කිරීමට නියමිතව තිබුණු බැවින් හා මෙය ඉතාමත් හදිසි කටයුත්තක් ලෙස සිදුවූ බැවින් කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීම මඟහැරී ඇති බව. ඒ අනුව ඉදිරියේදී කාර්යසාධන බැඳුම්කරයක් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | -එම- |
| (v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව රු.250,000 ඉක්මවන වැඩ කොන්ත්‍රාත්තු සඳහා තෝරාගත් ලංසුකරු වෙත විධිමත් ප්‍රතිග්‍රහන ලිපියක් නිකුත් කර විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කළ යුතු වුවද අස්ථිත්වය විසින් කොන්ත්‍රාත්තුව සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙය ඉතාමත් හදිසි කටයුත්තක් ලෙස සිදු වූ බැවින් විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් සකස් කොට අත්සන් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොතිබුණු බව. ඒ අනුව ඉදිරියේදී මෙවැනි සේවාවන් ලබා ගැනීමේදී කොන්ත්‍රාත් ගිවිසුමක් සකසා අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීමට බලාපොරොත්තු වන බව. | -එම- |
| (ආ) ප්‍රවාහන පහසුකම් සැපයීමේ ප්‍රසම්පාදනය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ. | | |
| (i) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9.1 වගන්තිය ප්‍රකාරව විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කළ යුතු අතර රු. 500,000 ඉක්මවන භාණ්ඩ හෝ සේවා කොන්ත්‍රාත්තුවක් සඳහා විධිමත් කොන්ත්‍රාත් ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු වුවත් සංස්ථාව විසින් වර්ෂ හතරකට අධික කාලයක් තිස්සේ ගමනාන්ත දහයකට පමණ ලබාගෙන තිබුණු ප්‍රවාහන සේවය සම්බන්ධව සැපයුම්කරුවන් සමග ගිවිසුම් අත්සන් කර නොතිබුණි. | ඉදිරි වසරේ ප්‍රවාහන ලංසුව සැපයුම්කරුවන්ට පිරිනැමීමේදී කොන්ත්‍රාත් ගිවිසුමක් අත්සන් කිරීමට බලාපොරොත්තු වන බව. | -එම- |
| (ii) ලංසු ඉදිරිපත් කරන ලද සැපයුම්කරුවන් 09 දෙනාගෙන් ඒ ඒ ගමනාන්ත සඳහා අවම මිල ඉදිරිපත් කරන ලද සැපයුම්කරු තෝරාගෙන එම සැපයුම්කරුවන්ගේ රථය භෞතිකව පරීක්ෂා කිරීම 2024 | දුර්වලතා හඳුනාගෙන ඇති බව හා ඉදිරියේදී තාක්ෂණික කමිටු සාමාජිකයන් සහභාගී කරවීමට කටයුතු සිදු කරන බව. | -එම- |

අගෝස්තු 29 දින සිදුකර තිබුණද ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් සහභාගී වී නොතිබුණු අතර එය ප්‍රවාහන අංශය වෙත පවරා තිබුණි.

## 3.5 බද්ධ ව්‍යාපාර කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෛද්‍ය සැපයීම් අංශයට ඖෂධ සැපයීමේදී පිළිපැදිය යුතු කොන්දේසි පිළිබඳව එම අංශයේ 2017 අප්‍රේල් 04 දිනැති අංක MSD/SB11/SPMC/ORD/PO/2017 දරණ ලිපිය මගින් දැනුවත් කර තිබුණ ද, සංස්ථාව විසින් බද්ධ ව්‍යාපාර සමඟ ඇති කරගත් ගිවිසුම් වල එම කොන්දේසි ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව වෛද්‍ය සැපයුම් අංශයට බෙදාහරින අවස්ථාව වන විට අදාළ ඖෂධයේ ඵලදායී ජීව කාලය අවම වශයෙන් සියයට 85 ක් පමණ පැවතිය යුතු වුවද බද්ධ ව්‍යාපාර ගිවිසුම් වල එය සියයට 75 ක් විය යුතු බව දක්වා තිබීමත්, ඖෂධ ප්‍රමිතියෙන් බැහැර අවස්ථාවලදී එම කාණ්ඩයට අදාළ මුළු ඉන්වොයිස් අගය හා ඉන් සියයට 25 ක් වූ එම ඖෂධ නිසිපරිදි විනාශ කිරීමේ පරිපාලන ගාස්තුවක් අය කරන නමුත් බද්ධ ව්‍යාපාර ගිවිසුම්වල එවැනි කොන්දේසීන් ඇතුළත් කර නොතිබීමත්, ප්‍රමාද වී සැපයුම් කළහොත් ඒ සඳහා දඩමුදල් අයකරන බව සඳහන් කර තිබුණද ඒ සම්බන්ධ කොන්දේසීන් බද්ධ ව්‍යාපාර ගිවිසුම් වල ඇතුළත් කර නොතිබීමත් හේතුවෙන් සංස්ථාවට පමණක් අදාල වගකීම් හා අලාභ දැරීමට සිදුව තිබුණි. | බද්ධ ව්‍යාපාර ගිවිසුමෙහි ඵලදායී ජීව කාලය අවම වශයෙන් සියයට 85 ක් කිරීම හා සියයට 25 ක් වන පරිපාලන ගාස්තුව හා දඩ මුදල් අයකරගැනීම සම්බන්ධව බද්ධ ව්‍යාපාර ගිවිසුමට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බව. | මෙහි අඩංගු කරුණු අභ්‍යන්තර චක්‍රලේඛයක් ලෙස නිකුත් කර බද්ධ ව්‍යාපාර සමග වූ ගිවිසුම් සංශෝධනය කිරීමට කටයුතු කල යුතුය. |

## 3.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංස්ථාවේ දැනට භාවිතා වන සිසිලන පද්ධතියේ ප්‍රමාණාත්මකභාවය පිළිබඳ 2019 වර්ෂයේදී සිදුකළ සවිස්තරාත්මක බලශක්ති විගණනයේ නිර්දේශයන් ප්‍රකාරව සකස්කළ සිසිලන ඉල්ලුම සපුරාලන කාර්යක්ෂම සිසිලන පද්ධතියක් ස්ථාපනය කිරීමේ | නව සිසිලන පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියට යටත්ව තාක්ෂණික හා මූල්‍ය ලංසු කැඳවීම් කළ බව. තාක්ෂණික ලංසු හා මූල්‍ය ලංසුව 2025 | අසාමාන්‍ය ප්‍රමාදය සම්බන්ධයෙන් පරීක්ෂා කර කඩිනම් පියවර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | |
|---|---|---|
| යෝජනාවට සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් එය ක්‍රියාත්මක කර නොතිබුණි. | අප්‍රේල් 23 වන දින විවෘත කරන ලද බව. තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් සිදු කොට ටෙන්ඩරය ප්‍රදානය කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුවට යොමු කිරීමට නියමිත බව. | |

### 3.7 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| යෝජිත ලෝටස් ෆාමා නව නිෂ්පාදනාගාරය ලෙස රටේ මූලික ඖෂධ අවශ්‍යතාව ආවරණය කෙරෙන නිෂ්පාදන කර්මාන්ත ශාලා 05ක් පිහිටුවීමට සැලසුම් කර තිබුණු අතර වසර 03කට පසුව ඉන් ප්‍රථම අදියර ලෙස මුඛ මාර්ගයෙන් ලබා දෙන සාමාන්‍ය ඖෂධ නිපදවීම සඳහා වන කර්මාන්ත ශාලාවක් පිහිටුවීම වෙනුවෙන් එක්සත් ජනපද ඩොලර් මිලියන 13.1කට සමාන රු.මිලියන 4,349.2ක වියදමක් ඇස්තමේන්තු කර තිබුණි. 2022 ඔක්තෝබර් 20 දිනැති අංක BP/44/22 දරන අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව හා ඔක්තෝබර් 07 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව මෙම ව්‍යාපෘතිය යටතේ අපේක්ෂිත නිෂ්පාදනාගාර 03 ක් ඉදිකිරීමට අක්කර 20ක වපසරිය ප්‍රමාණවත් බව දක්වා තිබුණද රු. මිලියන 322.4ක් වැයකර අක්කර 65ක් මිලදී ගෙන තිබුණි. තවද, 2024 පෙබරවාරි 02 දින රැස් වූ අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටුව විසින් ව්‍යාපෘතියට අදාල සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකළ යුතු බව දන්වා තිබුණද, ඒ සඳහා කටයුතු කර නොතිබුණි. 2022 සිට 2026 දක්වා වූ පස් අවුරුදු සැලැස්මට අනුව මෙම ව්‍යාපෘතිය වසර 03කදී නිම කිරීමට බලාපොරොත්තු වුවද විගණිත දිනය වූ 2025 මැයි 27 දින වන විට වසර 03කුත් මාස 05ක් ඉකුත් වී තිබුණද භෞතික ප්‍රගතිය ශුන්‍ය වී තිබුණි. | සියළුම කරුණු සැලකිල්ලට ගත් බව හා ඉදිරියේදී ව්‍යාපෘති කටයුතු ආරම්භ කරන බව. ශක්‍යතා අධ්‍යයනය සිදු කිරීමට අමාත්‍යාංශ උපදේශන කමිටුව මඟින් කමිටුවක් පත් කරන ලද බව හා එම පත් කරන ලද කමිටුවෙහි නිර්දේශ සහ උපදෙස් පරිදි ඉදිරියේදී ශක්‍යතා අධ්‍යනයක් සිදු කොට වාර්තාවක් සකස් කිරීමට බලාපොරොත්තු වන බව. | ව්‍යාපෘතිය කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතුය. |

### 3.8 මානව සම්පත් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2025 අප්‍රේල් 30 දිනට සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 449 ක් වූ අතර තත්‍ය | ඡේදය හා එකඟවන බව. | අත්‍යවශ්‍ය තනතුරු සඳහා පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම |

| | | |
|---|---|---|
| සේවක සංඛ්‍යාව 334ක් වීමෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව 115 ක් වී තිබුණි. ඒ අනුව මානව සම්පත් හා මූල්‍ය අංශ වල ප්‍රධාන තනතුරු 02 ක්ද ඇතුළුව තනතුරු 10ක්, විධායක නොවන ශ්‍රේණියේ තනතුරු 82 ක් හා සුළු සේවක තනතුරු 23ක් පුරප්පාඩු වී තිබුණි. | | සඳහා කඩිනම් පියවර ගැනීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2013 මාර්තු 28 දින කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණු සංස්ථාවේ තනතුරු සඳහා බඳවා ගැනීමේ පරිපාටිය වෙනස් කරමින් වරින් වර අනුමත කරගත් සංශෝධනයන් හා නව තනතුරු වලින් සමන්විත බඳවාගැනීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන බැවින් සංස්ථාවේ බඳවා ගැනිමේ ක්‍රියාවලිය සංකීර්ණ වි තිබු අතර එකම කාණ්ඩයට අයත් තනතුරු සඳහා විවිධ සුදුසුකම් යටතේ බඳවාගැනිම් කිරීමට මේ යටතේ අවස්ථාව සැලසී තිබුණි. | 2013 වසරට පෙර අනුමත කර ගත් තනතුරු සඳහා පැරණි බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වන අතර 2013 න් පසු අනුමත කර ගත් තනතුරු සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව බඳවා ගැනීමේ පරිපාටිය අනුමත කරනු ලබන්නේ නව ආදර්ශය අනුව බව. සියළු තනතුරු සඳහා නව ආදර්ශය අනුව බඳවා ගැනීමේ පරිපාටිය සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති බව. එක් කාණ්ඩයක් යටතට ගැනෙන තනතුරු සඳහා බඳවා ගැනීමේ සුදුසුකම් සමාන කර මෙහිදී සිදු වන අසාධාරණයන් ඉවත් කිරීමට පාලනාධිකාරිය මේ වන විටත් කටයුතු කරමින් සිටින බව. | මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කල යුතුය. |
| (ඇ) 2018 ඔක්තෝබර් 04 දින සිට 2024 දෙසැම්බර් 01 දක්වා කාල සීමාව තුළ අවස්ථා 6කදී පුවත්පත් දැන්වීම් මගින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (වට්ටෝරු හා පර්යේෂණ) තනතුර සඳහා නිලධාරියෙක් බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා තිබුණද සුදුසු නිලධාරියකු බඳවා ගැනීමට කටයුතු නොකර එම තනතුරේ රාජකාරී ඉටුකිරීම සඳහා 2016 වර්ෂයේ සිට කළමණාකරුවෙකු පත් කර තිබුණි. | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි - වට්ටෝරු, පර්යේෂණ හා සංවර්ධන සඳහා අවස්ථා 06කදී අයදුම්පත් කැඳවූ බව. අවස්ථා 5කදී සුදුසුකම් සහිත අයදුම්පත් ලැබී නොතිබුණු අතර එක් අවස්ථාවක් සඳහා සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වූවද අයදුම්කරු සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණ නොතිබුණු බව. | සුදුසුකම් ඇති නිලධාරියෙකු ඉක්මණින් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) තත්ත්ව පාලන නිලධාරී තනතුරු 02ක් සඳහා බඳවා ගැනීමට සමාලෝචිත වර්ෂයේ පවත්වන ලද සම්මුඛ පරික්ෂණයකින් තෝරාගෙන තිබුණු අභ්‍යන්තර අයදුම්කරුවෙකු ට අදාළ සම්මුඛ පරීක්ෂණයේදී කාර්යය සාධනය සම්බන්ධව ලකුණු 25 ම ලබාදී අනෙකුත් අභ්‍යන්තර අයදුම්කරුවන්ට ලකුණු 5 ක් 7 ක් වැනි අඩු ලකුණු ලබාදී තිබීම හා කාර්යය සාධනය සම්බන්ධව සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සියළුම සාමාජිකයින් එක්ව ලකුණු ලබා දී තිබීම යන කරුණු හේතුවෙන් එම සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉලක්ක ගත අපේක්ෂකයෙකු බඳවා ගැනීමට කටයුතු | බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් සම්මුඛ පරීක්ෂණයේ ලකුණු දීමේ ක්‍රමවේදය අනුව ලකුණු ලබා දී ඇති බව. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන නියෝජිතයාගේ අදහස් අනුව අනෙක් සියළුම සාමාජිකයන්ගේ එකගතාවයෙන් ලකුණු ලබා දීම තීරණය කර ඇති බව. | අපක්ෂපාතීව ස්වාධිනව හා විනිවිද පෙනෙන ආකාරයට සම්මුඛ පරීක්ෂණ මණ්ඩල කටයුතු කළ යුතුය. |

කර ඇති බවක් නිරීක්ෂණය විය.

| | | |
|---|---|---|
| (ඉ) තත්ත්ව පාලන කලමනාකරු තනතුර සඳහා සංස්ථාවේ පවත්නා පැරණි බඳවාගැනීම් පරිපාටිය (SOR) අනුව විශ්ලේෂණ රසායන විද්‍යාව හෝ තත්ත්ව ආරක්ෂණ ක්ෂේත්‍රයට අදාලව අවම වශයෙන් වසර 03ක පශ්චාත් පලපුරුද්දක් ලබා තිබීම සලකා බලන බව සඳහන්ව තිබුණි. බඳවාගැනීමේදී මෙම අංශ දෙකෙහිම නිපුණත්වයක් ඇති අයෙකු තෝරා ගත යුතු බවත් බඳවාගැනීම් පරිපාටිය අදාල පරිදි සංශෝධනය විය යුතු බවත් ආයතනය අදාල සංශෝධනයන් සම්බන්ධයෙන් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | කළමණාකරු - තත්ත්ව පාලන බඳවා ගැනීමේ පරිපාටියේ සංශෝධනයක් අවශ්‍ය නොවන අතර කළමණාකරු - තත්ත්ව සහතික ලෙස තනතුරක් අනුමත කරවාගෙන බඳවා ගැනීමේ පරිපාටිය අනුමැතිය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා යොමු කර ඇති බව. | මානව සම්පත් කළමනාකරණය විධිමත් කිරීමට කටයුතු කල යුතුය. |

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් ක්‍රියාකාරකම් 48න් 23ක් සම්බන්ධයෙන් ප්‍රගතිය දක්වා නොතිබුණු බැවින් ඒවායේ ප්‍රගතිය සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගැනීමට නොහැකි විය. | ඉදිරියේදී ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය ලබා දෙන විට අදාල ක්‍රියාකාරකම්වල නියම තත්ත්වය ලබා දීමට වග බලා ගන්නා බව. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය නිසි පරිදි වාර්තා කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) 2022 වර්ෂයේ සිට 2026 වර්ෂය දක්වා වූ වර්ෂ 05කට අදාළව පිළියෙළ කර තිබුණු සංයුක්ත සැලැස්මේ සම්පත් පුළුල් කිරීමෙන් හා උපරිම උපයෝජනයෙන් නිෂ්පාදිත ධාරිතාවය වැඩිකිරීම මගින් වාර්ෂිකව නිමැවුම සියයට 5 කින් වැඩි කර ගැනීම ප්‍රධානම අරමුණක් ලෙස සඳහන් වුවද එම ඉලක්කය සපුරා ගැනීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. | පවතින සම්පත් උපරිම ලෙස උපයෝජනය කරමින් වර්තමානයේ පවතින දුර්වලතාවයන් හඳුනාගෙන 2025 වර්ෂයේදී නිෂ්පාදන ධාරිතාවය වැඩි කර ගැනීමට කටයුතු කරන බව. | සංයුක්ත සැලැස්මේ සඳහන් ඉලක්ක සපුරා ගැනීම සඳහා අවශ්‍ය මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කළ යුතුය. |
| (ඇ) වාණිජමය ශක්‍යතාවයක් ඇති ඖෂධයක් හා අත්‍යවශ්‍ය ඖෂධයක් ඇතුළත් වන පරිදි වසරකට නව නිෂ්පාදන 05ක් හඳුන්වාදීම සංයුක්ත සැලැස්ම තුළ අරමුණක් ලෙස දක්වා තිබුණද එම අරමුණ කරා ළඟාවී නොතිබුණි. | එම දුර්වලතාවයන් හඳුනාගෙන 2025 වර්ෂයේදී කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව. | -එම- |